## 2021 වර්ශය සඳහා වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය යටතේ භාණ්ඩ, වැඩ, හා සේවා සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

### අයදුම්කරුවන් සඳහා උපදෙස් හා කොන්දේසි

2021 වර්ෂය සඳහා වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය වෙත වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය (Shopping Method) යටතේ භාණ්ඩ, වැඩ, හා සේවා සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් සහ ඊට අදාල ලියකියවිලි, 2021.02.15 දින සිට 2021.03.08 දින දක්වා කාර්යාල දින වල පෙ.ව. 4.00 දක්වා කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ ගිණුම් අංශය වෙතින් ලබා ගත හැක.

සැම විටම නිවැරදි තොරතුරු පමණක්ම සපයන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. සපයා ඇති කවර හෝ තොරතුරක් සාවද්‍ය බවට හෝ වැදගත් තොරතුරක් ලබාදීමෙන් වැලකී සිටින බවට පෙනී යන්නේ නම් එවැනි අයදුම්කරුවන් ලියාපදිංචිය සඳහා සුදුසුකම් නොලබනු ඇත.අසම්පූර්ණ හෝ අපැහැදිලි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**01.අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ලිපිලේඛන**

I. නීතීඥවරයකු/නොතාරිස්වරයකු හෝ සාමදාන විනිශ්වයකාරවරයෙකු විසින් සත්‍ය බවට සහතික කරන ලද ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්/සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් (ඉහත ලේඛනවලට අදාළව 2021.01.01 දිනට වලංගු වන සේ ලියාපදිංචි නොමැති ව්‍යාපාර මේ සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොලබයි)

II. සැපයුම්කරු හෝ ඔහුගේ ප්‍රධානියා නිෂ්පාදකයා නොවන අවස්ථාවකදී සැපයුම්කරු හෝ ඔහුගේ ප්‍රධානියා බලයලත් නියෝජිත හෝ බෙදාහරින්නා වන බවට නිෂ්පාදකයා විසින් ලිඛිතව සහතික කල යුතුය.

III. සිවිල් ඉදිකිරීම් වැඩ සඳහා ඉල්ලුම් කරන කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) කුමන විශේෂිත කාණ්ඩයක් / ශ්‍රේණියක් යටතේ අවසන් වරට (2021.01.01 දිනට වලංගු වන සේ) ලියාපදිංචි වී ඇතිද යන්න තහවුරු කිරීම සඳහා එම සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.

IV. ලියාපදිංචි වීම සඳහා අයිතම ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ මුල් පිටපත අනිවාර්යයෙන් ඇමිණිය යුතුය.

V. වැට් සඳහා ලියාපදිංචි වී ඇති අයදුම්කරුවන් විසින් වැට් සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය. තවද වැට් සඳහා ලියාපදිංචි වී නොමැති නම් ඒ සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙතින් ලබාගත් ලිපියක් ඇමිණිය යුතුය.

VI. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අවශ්‍ය සියලු ලේඛන සමඟ පහත සඳහන් ලිපිනයට **2021.03.08 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි** ලියාපදිංචි තැපෑලෙන් හෝ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ ගිණුම් අංශයේ ඇති ලංසු පෙට්ටියට බහාලීම සිදු කළ හැක.

අයදුම්කරුවන් විසින් අයදුම් පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහල කෙළවරේ **" සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021"** යනුවෙන් සඳහන් කල යුතුය.

ලිපිනය: ලේකම්
වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය
ගොවිජන මන්දිරය,
80/5, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

**02.අයදුම්කරුවන් සඳහා වන පොදු උපදෙස් හා කොන්දේසි**

I. කරුණාකර අයදුම්කරුට අදාල නොවන කවර හෝ අයිතමයක් ඇති නම් එහි ඉදිරියෙන් "අදාල නොවේ " යන්න සඳහන් කරන්න.

II. ලියාපදිංචි කිරීමෙන් පසුව යම් සමාගමක / ආයතනයක තැපැල් ලිපිනයෙහි යම් සංශෝධනයක් හෝ වෙනසක් සිදුවුවහොත්, එම ඉල්ලීම සලකා බලනු ලබනුයේ එම ඉල්ලීම සමඟ එකී සංශෝධනයට සම්බන්ධ අදාළ සමාගම / ආයතනය මඟින් නිකුත්කරන ලද සංශෝධිත සහතිකයෙහි සත්‍ය පිටපතක් ඉදිරිපත් කිරීමෙන් පමණි.

III. ලියාපදිංචි කිරීමෙන් පසුව කවර කරුණක් යටතේ හෝ අයිතම කිසිදු වෙනසක් සිදුකළ නොහැකි බව අයිතම අතර මාරුකිරීම්ද සිදු නොකරන බව සලකන්න.

IV. අයදුම්කරුගේ යම් ප්‍රමාද දෝෂයක් හෝ අනවධානය සම්බන්ධයෙන් වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය වගකීම භාර ගනු නොලැබේ.

V. එක් අයිතමයක් සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් **රු.1,000.00 (රුපියල් දහසයි)** ආපසු නොගෙවන ගාස්තුවක් අයකරනු ලැබේ. එක් අයදුම්කරුවෙකුට අයිතම කිහිපයක් සඳහා ඉල්ලුම් කල හැක. අයිතම ලියාපදිංචි කිරීමේ **ගාස්තු 2021.02.15** දින සිට **2021.03.08** දින දක්වා කාර්යාලීය දින වල පෙ.ව.9.00 සිට ප.ව.2.30 **දක්වා වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ සරප් අංශය** වෙත ගෙවීමට හැකියාව ඇත.

VI. 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාල වැඩිදුර තොරතුරු අවශ්‍ය වුවහොත් දුරකතන අංක 0112 883829 වෙතින් ලබා ගත හැක.

VII. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 (භාණ්ඩ සහ වැඩ) අංක 8.11.5 " ඇ" දරණ වගන්තියේ උපදෙස් ප්‍රකාරව **කොන්දේසි පැහැර හැර ඇති / අසාදු ලේඛනගත** සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවෙහි නම් සඳහන් සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන්ට ලියාපදිංචි වීම සඳහා අවසර නොලැබේ.

VIII. මිල ගණන් ඉදිරිපත් කළ පසු සැපයීම සඳහා අවශ්‍ය පරිදි තොග තබා ගැනීම සැපයුම්කරු / කොන්ත්‍රාත්කරු විසින් කළ යුතු අතර වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වන අවස්ථාවේ දී අවම වශයෙන් **එක් මසක ණය පහසුකම්** සැපයීමට සියලු සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ස්වයංක්‍රීයවම එකඟවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

IX. සාමාන්‍යයෙන් ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන්/ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු/මිල ගණන් කැඳවනු ලැබේ. එසේ වුවද අවශ්‍ය අවස්ථාවන්හිදී තෝරාගත් සීමිත සැපයුම්කරුවන් /කොන්ත්‍රාත්කරුවන් වෙතින් හෝ වෙනත් සැපයුම්කරුවන්ගෙන්/ කොන්ත්‍රාත්කරුවන් වෙතින් මිල ගණන් කැඳවීමේ සම්පූර්ණ අයිතිය වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය සතුවේ.

X. ලේකම්, වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන කමිටුවක් විසින් සියලු අයදුම්පත් සලකා බලන අතර, අවශ්‍ය සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පමණක් ලියාපදිංචි කෙරේ. අවශ්‍ය සුදුසුකම් සතුටුදායක ලෙස සම්පූර්ණකොට නොමැති සහ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

XI. මිල ගණන් ඉල්ලා සිටි අවස්ථාවක වාර 3 ක් තුල මිල ගණන් ඉදිරිපත් කිරීමට හා මිල ගණන් ලබා දීමට නොහැකි බව (“No Quote”) දැන්වීම හෝ ඇණවුමක් නියමිත වේලාවට ක්‍රියාත්මක කල නොහැකි හෝ ඉල්ලා සිටි අවස්ථාවක නියැදි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ සැපයුම්, පිරිවිතරයන්ට අනුකූල නොවන හෝ අනුමත නියැදියට වෙනස් සැපයුම් ඉදිරිපත් කරන හෝ සැපයුම්කරුවන්ගේ / කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචිය දැනුම් දීමකින් තොරව අවලංගු කරනු ඇත.

XII. 2021 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධව අවසන් තීරණය ගැනීමේ අයිතිය ලේකම් , වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය සතු වේ.

ලේකම්,
වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය
“ ගොවිජන මන්දිරය”,
අංක 80/5
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල